# ආයුබෝවන්

# බුද්ධ ධර්මය

## 7 ශ්‍රේණිය

10 වන පාඩම

# ගුරු සිත සනසවා අකුරු උගනිමු සොදවා

සැකසුම -:
පී.කේ.ස්වර්ණා සිරියලතා
ර/ගුරුබැවිල විද්‍යාලය.

# ගුරුවරයා ....................

ගුරු සිත උදාරයි සඳරැස් කිරණ වගේ
එය එක තැනක එක ගෙදරක නතර නොවේ
මැඳුරට මෙන්ම පැලටත් සඳ එළිය වැටේ
ගුරු සිත සඳට සම කළ හැටි බලනු අගේ

ගුරු ජීවිතය උදාරයි.

එය උත්තරීතරයි.

එය ජීවිතයක ආලෝකයයි.

ශිෂ්‍යාචාරයක පෙර ගමන්කරුයි.



ගුරු ශිෂ්‍ය සම්බන්ධතාවය		සිඟාලෝවාද සූත්‍රය

ගුරුවරුවරයා	=	දකුණු දිසාව

# ගුරුවරයාගෙන් සිසුන්ට යුතුකම්

- අප මැනවින් හික්මවීම.
- මැනවින් ඉගැන්වීම.
- සියලු ශිල්ප ඉගැන්වීම.
- යහළු මිත්‍රාදීන්ට හඳුන්වා දීම .
- අපට ආරක්ෂාවරණය සැලසීම .

# අප මැනවින් හික්මවීම

ගුරුවරයා දරුවන්ට යහපත් සිරිත් විරිත් පහදා දෙයි . දරුවන්ට කළ යුත්ත නොකළ යුත්ත පහදා දෙයි. මනා හික්මීමක් දරුවා තුළ ඇති කරයි .



# මැනවින් ඉගැන්වීම

දරුවන්ට තමන් දන්නා ශිල්පය ඔවුනට ගැලපෙන අයුරින් ලබාදෙයි. සංකීර්ණ විෂය කරුණු සරලව පහදා දීමට නව ඉගෙනුම් ක්‍රම හා සුදුසු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරයි .



# සියළු ශිල්ප ඉගැන්වීම

තම ශිෂ්‍යයා දැණුමෙන් මෙන්ම ශිල්පීය හැකියවෙන්ද පරිපූර් ණ පුද්ගලයෙකු බවට පත් කිරීමට අවශ්‍ය සියළු ශිල්ප ලබාදේ.



# යහළු මිත්‍රාදීන්ට හඳුන්වා දීම

- ගුරුවරයාගේ යහළු මිත්‍රයන්ට තම ශිෂ්‍යයන් හඳුන්වා දීමෙන් ශිෂ්‍යයාගේ සමාජ ජීවිතයට වටිනාකමක් එකතු කෙරේ . ගුරුවරයෙකු මඟින් බාහිර සමාජය දැන හැඳින ගැනීමට ශිෂ්‍යයාට අවස්ථාව උදාවෙයි .

# අපට උකවරණය සැලසීම

- ශිෂ්‍යයාට එල්ලවන විවිධ කරදර හිරිහැර වලින් මුදවා ගැනීමට පියවර ගැනීම සැබෑ ගුරුවරයෙකුගේ ලක්ෂණයකි.

# සිසුන්ගෙන් ගුරුවරයාට යුතුකම්

- ගුරුතුමා දුටුවිට හුනස්නෙන් නැගීසිටීම
- ගුරුතුමාට සියළු ඇප උපස්ථාන සිදු කිරීම
- ලබාදෙන උපදෙස්වලට හොඳින් සවන් දීම සහ ඒවා පිළිපැදීම
- අවශ්‍ය කටයුතු කරදීම
- හොඳින් ඉගෙනීම

# ගුරුතුමා දුටුවිට හුනස්නෙන් නැගී සිටීම

සිසුන්ගේ අභිවෘද්ධිය  වෙනුවෙන් නිරන්තර වෙහෙස මහන්සි වන උතුම් ගුරුවරයෙකු දුටුවිට ගෞරව දැක්වීම සිසුන්ගේ යුතුකමකි. ඒ සඳහා වාඩිවී සිටින විට හුනස්නෙන් නැගිට ආචාර දැක්වීම යහපත් සිසුන්ගේ ලක්ෂණයකි.

# සියළු ඇප උපස්ථාන සිදු කිරීම

- ගුරුවරයාට අවශ්‍ය උවහොත් ඇප උපස්ථා කිරීමට සිසුන් පසුබට නොවිය යුතුය. පාසලේදී වුව ද හදිසි අසනීපයක් වුවහොත් සිසුන් හැකි පමණින් ගුරුවරයාට උදව් කළ යුතුය. විශ්‍රාම ගිය පසුව වුව ද වයෝවෘද්ධ වුවිට ද ගුරුවරයාට උදව් කිරීම සිසුන්ගේ යුතුකමකි.

# ලබාදෙන උපදෙස්වලට හොඳින් සවන්දීම හා පිළිපැදීම.

- ගුරුවරයා උගන්වන විෂය කරුණුවලට මෙන්ම ලබාදෙන උපදෙස්වලට මැනවින් සවන්දීම හා ඒවා තේරුම් ගෙන ඒ අනුව කටයුතු කිරීම යහපත් ශිෂ්‍යයකුගේ ලක්ෂණයකි. හොඳ අධ්‍යාපනයක් සඳහා සවන්දීම අත්‍යාවශ්‍යය.එසේම උගත් කරුණු ජීවිතයේදී පිළිපැදීම ද කළ යුතුය.



# අවශ්‍ය කටයුතු සිදුකර දීම

ගුරුවරයාගේ කටයුතු හැකි පමණින් ඉටුකරදීම ශිෂ්‍යයන්ගේ යුතුකමකි.

පාසලේදී මෙන්ම සිප්සතර ලබා වැඩිහිටියන් වූ පසු විවිධ රැකියාවල නිරතවන විට වුවද තම ගුරුවරුන් වෙනුවෙන් අවශ්‍ය කටයුතු ඉටුකල හැකිය .

# හොඳින් ඉගෙනගැනීම

සිසුන්ට  තමාගේ ගුරුවරයාට දිය හැකි හොඳම ත්‍යාගය වන්නේ හොඳින් ඉගෙනගැනීම යි. ගුරුවරයාගේ ලොකුම සතුට දරුවන් හොඳින් ඉගෙන ගන්නා ආකාරය දැකීම සහ අනාගතයේ දී හොඳ පුරවැසියන් වනු දැකීමය.

# ස්තූතියි